# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,640 — 1959 ජනවාරි 16 වැනි සිකුරාද—16.1.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 119 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 120 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 121 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායණී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

අධ්‍යයන වර්ෂය පටන් ගන්නා දින යථා කාලයේදී දන්වනු ලැබේ.

මෙම පන්තිවල උගෙන සාමර්ථ්‍යය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවනට රක්ෂාවල් ලබාදීම සම්බන්ධයෙන් ආණ්ඩුව බැඳී නැත.

ඇල්. එච්. සුමනදාස,
වැඩබලන රෙජිස්ට්‍රාර්.

1959 ජනවාරි මස 10 දින,
කොළඹ 10යේ ලංකා කාර්මික විද්‍යාලයීය
දෙපාර්තමේන්තුවේදීය.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන උපකරණ වලින් ගොනු කවර ආදිය සාදා සැපයීම සඳහා 1959 පෙබරවාරි 3 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 පෙබරවාරි 2 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 16 වැනි දින,
කොළඹ දීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### මෘදු වානේ පොලු—පැතලි සහ රවුම්—සැපයීම

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) මෘදු වානේ පොලු—පැතලි සහ රවුම්—සැපයීම සඳහා 1959 මාර්තු 31 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මාර්තු 30 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර්කරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන් දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 16 වැනි දින,
කොළඹ දීය.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

ආහාර හා කෘෂිකම් අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන් විසින් 1959 මාර්තු 17 වැනි දින පෙරවරු 9.30 දක්වා කෘෂිකම් දෙපාර්තමේන්තුවට ජීවාන්තක පෝර (ඇමෝනියම් සල්ෆේට්) ටැන්ඩර් අංක 210, සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, අධිකාරි තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 12 දින,
කොළඹ.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ගුදිරි මහන රෙදි, අමුරෙදි සහ සැටින් ඩ්‍රිල් සැපයීම

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) නිල් ඉරි සහිත ගුදිරි මහන රෙදි, අමු රෙදි සහ සැටින් ඩ්‍රිල් සැපයීම සඳහා 1959, මාර්තු 3 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මාර්තු 2 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර් කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන් දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 16 වැනි දින,
කොළඹදීය.

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### අමු ඉඟුරු සහ අමු කහ සැපයීම හා ගෙනැවිත් භාරදීම

කොළඹ 5, නාරාහේන්පිට ගොවිකම් කාර්යාලයේ කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැන විසින්, මීරිගම, දුම්රිය ස්ථානාධිපතිගේ බාරේ, මීරිගම කෘෂිකම් ව්‍යාප්ති නිලධාරි තැන වෙත ඔහුට අවශ්‍ය අන්දමටත්, උවමනා අවස්ථාවකත් 1958—59 මුදල් වර්ෂය තුළ පහත සඳහන් ද්‍රව්‍ය සැපයීමට හා ගෙනැවිත් භාරදීම් සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1959 පෙබරවාරි 9 වැනි දින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

| වර්ගය | ස්ථානය | උවමනා ගණන රාත්තල් |
|---|---|---|
| අමු ඉඟුරු | රජයේ කෘෂිකම් ව්‍යාප්ති මධ්‍යස්ථානය මීරිගම | 20,000 |
| අමු කහ | ,, ,, | 20,000 |

මේ ද්‍රව්‍යයන් නොමිශ්‍ර හා පිරිසුදුව ගෝනිවල ඔතා තිබිය යුතුය. තවද මේ ද්‍රව්‍යයන් භාරගනු ලබන්නේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ උද්භිද රෝග නිධානඥ තැන විසින් ඒවා පරීක්ෂා කර ඔහු විසින් කරනු ලබන තීරණයන් උඩය.

(11) කොන්ත්‍රාත්කරුවෙකුගේ සේවකයෙකු විසින් හෝ සේවකයෙක් වෙනුවෙන් හෝ 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥ පනත (117 ඡේදය) හෝ ඊට අදාල ව්‍යවස්ථානුකූල වෙනස් කම් ඇතොත් ඒවා යටතේ හෝ ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත් ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කල යුතුයි.

(12) තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කිරීම පිණිස පුහුණු හෝ නුපුහුණු හෝ ලාංකික කම්කරුවන් පමණක් යෙදිය යුතුයි. තවද හැකි තරම් දුරට මෙම කම්කරුවන් එම වැඩය ඇති පලාතෙන්ම සොයා ගත යුතුයි.

කොන්ත්‍රාත්කරුවා මෙම කොන්දේසියට පිටුපා කටයුතු කරයි නම් ඔහුගේ කොන්ත්‍රාත්තුව අවලංගු වීමට ඉඩ තිබේ. එහෙත් විශේෂ හේතු උඩ තමන් කොන්ත්‍රාත්තුවට බැඳී සිටින කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුරාධපුරයේ දිස්ත්‍රික්කයේ පරිපාලන නිලධාරි තැන ගේත් අනුමැතිය ඇතිව ලියවිල්ලකින් දෙන ලද අවසරය පිට ලාංකික නොවන කම්කරුවන් හෝ එම වැඩය කිරීමට ඇති පලාතේ පදිංචි නොවන ලාංකික කම්කරුවන් හෝ වැඩට ගැනීමට කොන්ත්‍රාත්කරුට හැකි වෙනවා ඇත.

ලියවිල්ලකින් තබන ලද අවසරයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ එම වැඩය කිරීමට ඇති පලාතේ පදිංචි නොවන කම්කරුවන් හෝ වැඩට ගැනීම නීත්‍යනුකූල නොවේ. එසේ කලහොත් මෙම කොන්ත්‍රාත්තුව කඩ කලා වනු ඇත.

(13) වැඩට ගැනීමට නුසුදුසු යයි හැඟෙන ඕනෑම කම්කරුවෙක් කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය රජය සතුවේ.

(14) කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට අවශ්‍යයයි පෙනී ගියහොත් තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ වියදමින් ඇප කරුවන් එක් කෙනෙක් ලවා හෝ ඊට වැඩි ගණනක් ලවා හෝ පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානමින් සිටිය යුතුයි. මෙම ඇප කරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කල අය විය යුතුයි.

(15) කොන්ත්‍රාත්තුවේ සඳහන් වැඩය අසතුටුදායක ලෙස කිරීම නිසාත්, කොන්දේසි ඉටු නොකිරීම නිසාත් කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සතුවේ.

(16) රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයේ නම සඳහන් කෙනෙකු සමඟ හෝ එම අය හා එකතුව ඉදිරිපත්වන කෙනෙකු සමඟ හෝ රජයට නුසුදුසු යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

(17) කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුනහොත්, නැතහොත් ඔහු විසින් සපයා ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ එම ස්ථානයෙහි තැබුවහොත් එම දැන්වීම් ඔහුටම දුන් ලෙස සලකනු ලැබේ.

(18) වැඩි විස්තර සඳහා අනුරාධපුරයේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලියා විමසිය යුතුයි. එසේ ලිවීමේ දී රාජකාරි ලිපිනයට එවිය යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1959යේ ජනවාරි 10 වැනිද,
පේරාදෙණියේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 යේ පෙබරවාරි මස 13 වැනි දින දවල් 12 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ ලද්දූව වරාපිටිය, කුරුදිය ව්‍යාපාරය දියුණු කිරීම සඳහා රුපියල් 25,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කළුතර, උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි විසින් 1959 යේ පෙබරවාරි මස 6 වැනි දින සිට 10 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා රුපියල් 25 ක තැන්පත් මුදලක් කළුතර කච්චේරියේ හෝ වාරිමාර්ග අධ්‍යක්ෂක තුමා නමට ගත් මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිලිගැනීම හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

වැඩි විස්තර කළුතර උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරීගෙන් විමසන්න.

ජී. රණසිංහ,
කළුතර උප ප්‍රාදේශීය වාරිමාර්ග
නිලධාරි.

1958 දෙසැම්බර් 19 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
කළුතර.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුව ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මින්නේරි ව්‍යාපාරයේ ඩී/28 ඇල අද්දර යන පාරේ සැතැපුම් 1, දම්වැල් 40 සිට සැතැපුම් 2, දම්වැල් 8 දක්වා කොටස ගල් දමා තාර දැමීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000ට හෝ ඉන් ඉහළ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

1959 ජනවාරි මස 19 වෙනි දින සිට 24 වෙනි දින දක්වා හිඟුරක්ගොඩ, තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් ටෙන්ඩරයකට රුපියල් 25ක් තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා වෙත තැන්පත් කළ යුතුය.

මේ සම්බන්ධ සියළු විස්තර සඳහා තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරුතුමා ගෙන් විමසන්න.

ජී. ඇස්. ඇම්. හොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
තමන්කඩුව උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
හිඟුරක්ගොඩ.
1. 1. 59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ වාරිමාර්ග කඳවුරට ඇතුළුවීමේ පාරට ගල් අතුරා තාර දැමීම සඳහා 1959 ක්වූ පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා පෙරවරු 11.30 වන තුරු ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවර වල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති, රුපියල් 25ක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කල බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1959 ජනවාරි 16 වැනි දින සිට 1959 පෙබරවාරි 7 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
රත්නපුර උප කොට්ඨාශය භාර වාරිමාර්ග
නිලධාරි තැන.

1958 දෙසැම්බර් 27 වැනි දින,
වාරිමාර්ග කාර්යාලයය,
රත්නපුර.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මින්නේරිය ව්‍යාපාරයේ හන්ටර් පාරේ හයවෙනි, හත්වෙනි, සහ අටවෙනි සැතැපුම්වල ගල් දමා තාර දැමීම සඳහා පොළොන්නරුවේ ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මෙම දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් 45,000, 45,000 සහ රුපියල් 8,000ට හෝ ඉන් ඉහළ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් වෙන් වෙන ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

1959 ජනවාරි මස 20 වෙනි දින සිට 24 වෙනි දින දක්වා හිඟුරක්ගොඩ, තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් පළමු සහ දෙවැනි ටෙන්ඩර් වලට

රුපියල් 50 බැගින් ද, තුන්වෙනි ටෙන්ඩරයට රුපියල් 25ක් ද තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු මහතා වෙත තැන්පත් කළ යුතුය.

මේ සම්බන්ධව සියළු විස්තර සඳහා තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
තමන්කඩුව උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
හිඟුරක්ගොඩ.
6.1.59

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පුස්තකාල පොත් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර—1958/59

පුස්තකාල පොත් සැපයීම සඳහා 1959 පෙබරවාරි මස 6 වන සිකුරාදා පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට, අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙනුවෙන්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරාදිය සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටෙන්ඩර් කරුවන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහි ද කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියක ද රුපියල් 100ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1959 පෙබරවාරි මස 5 වන දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 ජනවාරි 16 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### BT/ආරෙපන්න ජ්‍යෙෂ්ඨ පාඨශාලාව සහ T/ඇතාබැඳිවැව සිංහල මිශ්‍ර පාඨශාලාව පාසල් ගොඩනැගිලි තැනීම

BT/ආරපත්ත ජ්‍යෙෂ්ඨ පාඨශාලාවේ විද්‍යාංශ ගොඩනැගිල්ද, පාසල් ගොඩනැගිල්ලක් ද, ළිඳක් සහ වැසිකිළිද,

T/ඇතාබැඳිවැව සිංහල මිශ්‍ර පාඨශාලාවේ ගුරු නිවාසද, පාසල් ගොඩනැගිල්ලක් ද, ළිඳක් සහ වැසිකිළිද—

තැනීම සම්බන්ධයෙන් 1959 ජනවාරි 2 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ටෙන්ඩර් නිවේදනයේ ප්‍රකාර ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් අතුරෙන් යමෙක් දැනටමත් රජයේ කොන්ත්‍රාත් වැඩ භාරගෙන ඒවායේ යෙදී සිටී නම් එවැනි අයවලුන් එකී වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට එම වැඩ කටයුතු භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පෝර්ම ඉල්ලීමේදී ඉදිරිපත් කළ යුතුයි.

සහතික පත්‍රය තිබිය යුත්තේ පහත පෙනෙන පෝර්මයේ අන්දමටය :—

වැඩයේ නම :————.

කොන්ත්‍රාත්තුවේ මුදල :————.

කොන්ත්‍රාත්තුවේ දිනය :————.

සම්පූර්ණ කළයුතු නියමිත දිනය කල්දී තිබේද යන වග :————.

වැඩ කරගෙන යන අන්දම සතුටුදායකද නැද්ද යන වග :————.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ අත්සන සහ තනතුර :————.

ඉහත සඳහන් වන්නේ මා භාරගෙන තිබෙන රජයේ සියලුම කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සම්පූර්ණ සටහනයි.

————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

2. යම්කිසි කොන්ත්‍රාත්කරුවෙක් ටෙන්ඩර් පෝර්ම ඉල්වා සිටීමේ දී දැනට කරගෙන යන ඔහුගේ කොන්ත්‍රාත් වැඩ පිළිබඳ කරුණු ඕනෑකමින්ම සඟවතොත් ඔහුගේ කොන්ත්‍රාත්තුවේ කුමන අවස්ථාවකදී වුවත් එය අවලංගු කිරීමේ බලය රජය සතුව පවතී.

3. ඉහත සඳහන් වැඩ පිළිබඳ ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1959 ජනවාරි 30 දා දක්වා ද ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ අවසාන දිනය 1959 ජනවාරි 29 දා දක්වා ද දීර්ඝකොට තිබේ.

සී. තනිකාසලම්,
වැ. බ. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
මඩකලපුව,
1959 ජනවාරි 9 දින.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ නො. 11,633 හා 2.1.59 වෙනි දින දරන ගැසට් පත්‍රයේ පලවූ 22.12.58 වෙනි දින දරන මගේ ටෙන්ඩර් දැන්වීම සඳහා ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි :—

වැඩයේ නම :————.

කොන්ත්‍රාත්තුවේ දිනය :————.

කොන්ත්‍රාත්තුවේ මුලු ගණන :————.

වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල්දීම් ඇතිව) :————.

වැඩය සතුටුදායකද අසතුටුදායකද යන වග :————.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන :————.

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩවල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/කරමු.

————.
ටෙන්ඩර් කරුගේ අත්සන.

දිනය :————.

ටෙන්ඩර් කරුවන් විසින් පූර්වෝක්ත තුන්වන (3) ඡේදයේ අඩංගු තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍ය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

ජී. නාගොඩවිතාන,
ඌ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959 ජනවාරි 8 වැනි දින,
බන්ඩාරවෙල ඌ. ප. අධ්‍යාපන කාර්යාලයේදීය.

---

## ජල විදුලි ක්‍රමය II වෙනි වේදිකාවේ කොළඹ පිහිටි උප විදුලි ස්ථානවලට උපකරණ සැපයීම සහ භාර දීම

1. රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සැපයීම සහ බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1959ක් වූ පෙබරවාරි මස 25 වන බදාදා පූ. භා. 9.30 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්ෂ 1959ක් වූ පෙබරවාරි මස 20 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. පළමු වතාවේ ටෙන්ඩර් පොත් ලබාගත් ටෙන්ඩර්කරුවන්ට නොමිලයේ ටෙන්ඩර් පොත් නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1959ක් වූ පෙබරවාරි මස 25 වන දින පූ. භා. 10ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1959 ජනවාරි 10 වැනි දින
තැ. පෙ. 540, කොළඹ,

---

## උළු ගඩොල් කර්මාන්ත ශාලාවක් පිහිටුවීම

උළු ගඩොල් කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා 1959 අප්‍රේල් 15 වැනි බදාදා දවල් 12 දක්වා, 2 වැනි කොළඹ ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරණ ස්ථානයේ කර්මාන්ත අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

වැඩි විස්තර අඩංගු ටෙන්ඩර් දැන්වීම 2 කොළඹ ශ්‍රී ජිනරතන පාරේ අංක 48 දරණ ස්ථානයේ නියෝජනා අංශයේ වැඩ බලන කර්මාන්ත අධ්‍යක්ෂකගෙන් ලබා ගත හැක.

ඊ. සී. ඇස්. පෝල්,
වැ. බ. කර්මාන්ත අධ්‍යක්ෂ.

1959 ජනවාරි 12 වැනිදා,
2 කොළඹ,
කර්මාන්ත දෙපාර්තමේන්තුවේ
නියෝජනා අංශයේදී ය.

---

## මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්මික වඩු පාසලක් අළුත්වැඩියා කිරීම හා වැලිගම, පැලැනේ ගාලු පාරට යාබදව පිහිටි පරණ සිනිමා හල් ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම

මාතර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන විසින් ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් 1959 පෙබරවාරි මස 10 වෙනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර්පත් බාරගනු ලැබේ.

2. මේ වැඩ සම්බන්ධ සියළුම විස්තර කාර්‍යාල වේලාවන් හිදී මාතර දිසාපති කාර්‍යාලයේ ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත අංශයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් කළ යුත්තේ මාතර දිසාපති තැනගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර වලය.

3. ටෙන්ඩර් පත්‍ර එවන සියළුම ලියුම් කවරවල වම්පැත්තේ ඉහල කොනේ "පරණ සිනිමා හල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සම්බන්ධ ටෙන්ඩර් පත්‍ර" යන්නෙන් සඳහන් කර ලියා පදිංචි කළ තැපැලෙන් මාතර දිසාපති තැන නමට එවිය යුතුයි. නො එසේ නම් කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුයි. 1959 පෙබරවාරි මස 10 වෙනි දින පෙරවරු 10.30ට මෙම කච්චේරියේ ග්‍රාම සංවර්ධන හා ගෘහකර්මාන්ත පිළිබඳ දිස්ත්‍රික් නිලධාරිතැන විසින් මෙම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. මෙම අවස්ථාවේ ටෙන්ඩර් කරුවන්ටද පැමිණ සිටිය හැක.

4. එක් එක් පත්‍රිකාවක් සඳහා රු. 10 බැගින් මාතර කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ වැඩය පිළිබඳ පෝර්මකොළ ලබා ගත හැක.

කේ. ජේ. සී. විජයවර්ධන,
මාතර දිසාපති වෙනුවට.

8. 1. 1959.
කච්චේරිය, මාතර.

---

## මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා 1959 පෙබරවාරි මස 9 වෙනි දින පෙරවරු 9.30 දක්වා මාතර දිසාපති තුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගන්නවා ඇත :—

### ගඟබඩ පත්තුව

(1) බෙරවන්කෙත අමුණ අළුත්වැඩියා කිරීම—කිරින්ද.
(2) ගල් අමුණ අළුත්වැඩියා කිරීම—හඳපාන්විල.
(3) පාළුවත්ත අමුණ සෑදීම—කිතලගම.
(4) ලොකුකැටගේ අමුණ සෑදීම—කිතලගම.
(5) අත්තනේ අමුණ සෑදීම—පුහුල්වැල්ල.
(6) දෙල්ගහ දෙනිය පැනි බැම්ම සෑදීම—යටියන.

### වැල්ලබඩ පත්තුව

(7) අන්ගහ ලග ඇලවෙල්ල සෑදීම—දම්යන්ගොඩ.
(8) පහල අද්දරගොඩ අමුණ සෑදීම—පානගම.
(9) කච්ඡුව වැව බෝක්කුව අළුත්වැඩියා කිරීම—නාඔටුන්න.

### වැලිගම් කෝරළය

(10) මිදිමෝදර කරදිය වැළැක්වීමේ දොර අළුත්වැඩියා කිරීම—මිදිගම.
(11) වෙල්ලගාව ලියද්ද අමුණ සෑදීම—මාලිම්බඩ 3.
(12) ගරාඩුව කලපුව ප්‍රතිසංස්කරණය කිරීම—මිරිස්ස.

2. මේ වැඩ ගැන සියළු විස්තර ද, කාර්‍යාල වේලාවන් හිදී මාතර ආණ්ඩුවේ ඒජන්ත තැනගෙන් දැනගත හැක. ටෙන්ඩර් කළ යුත්තේ ඔහුගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍රවලය. 1959 ජනවාරි මස 17 වෙනිදා සිට 1959 පෙබරවාරි මස 6 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම වැඩ සඳහා රුපියල් 10 බැගින් මෙම කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම් කොල ලබාගත හැක.

3. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ රුපියල් 1,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ය. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පැමිණෙන විට ලියා පදිංචි කිරීමේ රැකෝඩ් පොත ද රැගෙන ආ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර එවන සියළුම ලියුම් කවර වල වම් පැත්තේ ඉහල කොනේ "සුළු වාරිමාර්ග සම්බන්ධ ටෙන්ඩර් පත්‍ර" යන්නෙන් සඳහන් කර රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. නැත් නම් කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. 1959 පෙබරවාරි 9 වෙනි දින පෙරවරු 9.45 ට මෙම කච්චේරියේ සහකාර ඒජන්ත අධිකාරි තැන විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

5. 9. 2. 59 වෙනි දින සිට දවස් 45ක් ගතවනතුරු තමන් ඉදිරිපත් කරණ ලද ටෙන්ඩර් පත්‍රය අනුව වැඩ භාරගැනීමට සූදානම්ව සිටිය යුතුය.

පී. හත්තොටුව,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත
තැන වෙනුවට.

1959 ජනවාරි මස 8 වෙනි දින,
කච්චේරිය, මාතර.

---

## වවුනියා දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් වැඩ සඳහා 1959 පෙබරවාරි මස 10 දින පෙරවරු 9.30 දක්වා වවුනියාවේ දිසාපති තැන විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ :—

| ප්‍රතිසංස්කරණ | හොරොව් බැඳීම |
|---|---|
| **වවුනියා, ද. දෙ. කෝට්ඨාශය** | **වවුනියා ද. දෙ. කෝට්ඨාශය** |
| 1. පූනියාකඩ්ඩිනාකුලම් | 1. ඉලුප්පායිකුලම්. |
| 2. සින්නාකුලම්-ඉන්ලට්කානල් | 2. පෙරිය පුලියන්කුලම්. |
| 3. මලිකායි. | 3. තන්ඩිකුලම්. |
| 4. සන්ඩරුඩයර් පුලියන්කුලම්. | 4. අන්දිය පුලියන්කුලම්. |
| 5. මුන්ඩිරිප්පු. | 5. පෙරිය නොච්චිකුලම්. |
| 6. පුලිතරිවපුලියන් කුලම්. | 6. ඕමන්තෙයි. |
| 7. මාරකරම් පලෙයි. | 7. නාවට්කුලම්. |
| | 8. නෙල්වැලිකුලම්. |
| **වවුනියා උතුරු කෝට්ඨාශය** | **වවුනියා දකුණු-සිංහල කෝට්ඨාශය** |
| 8. සන්ගිලියන් මුරිප්පු. | 9. පුදුවිලන්කුලම. |
| 9. කරපුකුට්ටි. | **වවුනියා උතුරු කෝට්ඨාශය** |
| **වවුනියා ද. සි. කෝට්ඨාශය** | 10. කන්චුරාමෝදෙයි. |
| 10. පරයාසින්නකුලම්. | 11. කුලන්කුලම්. |
| | 12. වේලන්කුලම්. |
| | 13. කරුවේලන්කන්දල්. |
| | 14. ඉයන්කාන්කුලම්. |

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

බොරැල්ලේ රජයේ මුද්‍රණාලයේ කඩදාසි ගබඩාවේ වහල සිවිලින් ගැසීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ, නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ ජනවාරි මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන් ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර බලාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

---

අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වර්ෂය තුලදී අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අවිස්සාවේල්ල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ ජනවාරි මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

---

අවිස්සාවේල්ලේ බතන්ගල බාලිකාවන්ගේ ගොවි පාසැලක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අවිස්සාවේල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ ජනවාරි මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 375,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන් ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

---

බූස්සේ ආහාර ගබඩාවේ තීන්ත ගෑම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ගාල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ ජනවාරි මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන් ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු : 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

---

පුත්තලමේ " සී. ආර්. ඇන්. වී. ආර් " එක අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පුත්තලමේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතම එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ ජනවාරි මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන් ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ : වැ : දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

කෑගල්ලේ දිස්ත්‍රික්කයේ ("ඒ" කොටස) ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වර්ෂය තුළදී අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කෑගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ ජනවාරි මස 23 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. ශේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

කෑගල්ලේ දිස්ත්‍රික්කයේ ("බී" කොටස) ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වර්ෂය තුළදී අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කෑගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ ජනවාරි මස 23 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. ශේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.12.

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ආමර් වීදියේ සහ මසංගස් වීදියේ තට්ටු නිවාස

ආමර් වීදියේ සහ මසංගස් වීදියේ සාදා නිමවීමට ආසන්න නිදන කාමර එක හා දෙක බැගින් යුත් තට්ටු නිවාස කුලියට දීම සඳහා ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් අය මෙකී නිවාසයන් සඳහා සුදුස්සන් නොවනු ඇත :—

(අ) රුපියල් 400 කට වැඩි මාසික ආදායමක් ඇති අය—මාසික ආදායම යනුවෙන් අදහස් කරනුයේ පුරුෂයාගේ සහ භාය්‍යාවගේ සම්පූර්ණ මාසික ආදායමයි.
(ආ) තමන් නමින් හෝ සිය භාය්‍යාව/පුරුෂයා නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයකු නමින් හෝ ගෙයක් තිබෙන අය.
(ඇ) ළමයින් දෙදෙනකුට අඩුව ඇති අය.
(ඈ) ඉල්ලුම් පත ඉදිරිපත් කිරීමට යටත් පිරිසෙයින් දෙමසකට වත් පෙර මැද කොළඹ ජන්ද කොට්ඨාශයෙහි පදිංචිව නොසිටි අය.

නිදන කාමර දෙකකින් යුත් නිවාසයක මාසික කුලිය රුපියල් 62.50 ටත් රුපියල් 70 ටත් අතර වේ. නිදන කාමර එකකින් යුත් නිවාසයක මාසික කුලිය රුපියල් 35 ටත් රුපියල් 40 ටත් අතර වේ.

කුඩා තට්ටු නිවාස සඳහා සලකා බලනුයේ මසකට රුපියල් 200 කට නොවැඩි ආදායමක් ලබන අය පමණක්ය.

මෙම නිවාස තැනීමේදී ගෙවල් අහිමිවූ හෝ ගෙවල් අහිමි වන අයට මෙම නිවාස පළමුවෙන් ලබාදෙනු ඇත.

ලබන අවුරුද්ද තුළදී හිස් වන නිවාස සඳහා පදිංචි කරුවන් මෙම නිවේදනයට අනුකූලව ඉල්ලුම් කරන්නන් ගෙන් තෝරා ගන්නවා ඇත.

ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් පත් පිළියෙල කොට 1959 පෙබරවාරි මස 21 දින පස්වරු 1 ට පෙර ජාතික නිවාස කොමසාරිස් තැනට ලැබෙන සේ එවිය යුතුය.

1959 පෙබරවාරි මස 21 දින ඉල්ලුම් පත්‍ර භාර ගැනීම අවසාන වනවා ඇත. ඉල්ලුම් පත්‍රය තැපැල් කර දින 14 ක් තුළදී එය ලැබුණු බව දන්වා පිළිතුරක් නොලැබුණහොත් ඒ බව තැපැල් කායඝීලයේ ලියා පදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බ්ලූමැන්ඩල් පාරේ තට්ටු නිවාස

බ්ලූමැන්ඩල් පාරේ සාදා නිමවීමට ආසන්න නිදන කාමර එක හා දෙක බැගින් යුත් තට්ටු නිවාස කුලියට දීම සඳහා ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් අය මෙකී නිවාසයන් සඳහා සුදුස්සන් නොවනු ඇත :—

(අ) රුපියල් 400 කට වැඩි මාසික ආදායමක් ඇති අය—මාසික ආදායම යනුවෙන් අදහස් කරනුයේ පුරුෂයාගේ සහ භාය්‍යාවගේ සම්පූර්ණ මාසික ආදායමයි.
(ආ) තමන් නමින් හෝ සිය භාය්‍යාව/පුරුෂයා නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයකු නමින් හෝ ගෙයක් තිබෙන අය.
(ඇ) ළමයින් දෙදෙනකුට අඩුව ඇති අය.
(ඈ) ඉල්ලුම් පත ඉදිරිපත් කිරීමට යටත් පිරිසෙයින් දෙමසකට වත් පෙර උතුරු කොළඹ ජන්ද කොට්ඨාශයෙහි පදිංචිව නොසිටි අය.

නිදන කාමර දෙකකින් යුත් නිවාසයක මාසික කුලිය රුපියල් 62.50 ටත් රුපියල් 70 ටත් අතර වේ. නිදන කාමර එකකින් යුත් නිවාසයක මාසික කුලිය රුපියල් 35 ටත් රුපියල් 40 ටත් අතර වේ.

කුඩා තට්ටු නිවාස සඳහා සලකා බලනුයේ මසකට රුපියල් 200 කට නොවැඩි ආදායමක් ලබන අය පමණක්ය.

මෙම නිවාස තැනීමේදී ගෙවල් අහිමිවූ හෝ ගෙවල් අහිමි වන අයට මෙම නිවාස පළමුවෙන් ලබාදෙනු ඇත.

ලබන අවුරුද්ද තුළදී හිස් වන නිවාස සඳහා පදිංචි කරුවන් මෙම නිවේදනයට අනුකූලව ඉල්ලුම් කරන්නන් ගෙන් තෝරා ගන්නවා ඇත.

ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් පත් පිළියෙල කොට 1959 පෙබරවාරි මස 21 දින පස්වරු 1 ට පෙර ජාතික නිවාස කොමසාරිස් තැනට ලැබෙන සේ එවිය යුතුය.

1959 පෙබරවාරි මස 21 දින ඉල්ලුම් පත්‍ර භාර ගැනීම අවසාන වනවා ඇත. ඉල්ලුම් පත්‍රය තැපැල් කර දින 14 ක් තුළදී එය ලැබුණු බව දන්වා පිළිතුරක් නොලැබුණහොත් ඒ බව තැපැල් කායඝීලයේ ලියා පදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.